සියළුම හිමිකම් ඇවිරිණි]
All Rights Reserved ]

# පාසල් වලට සිසුන් තොරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය

I පත්‍රය

නැණ ලොවට පා නඟන හපනුන්ට මඟ කියන

# “අදිති”

10

පැය 01 යි

විභාග අංකය ..............................

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

❖ **අංක 1 සහ 2 ප්‍රශ්නවලට මුලින් දී ඇති රූපයට ගැළපෙන සමාන රූපය තෝරන්න.**

01.



1 2 3

02.



1 2 3

❖ **ප්‍රශ්න අංක 3 සහ 4 ප්‍රශ්න වලට පහත රූපය අසුරින් පිළිතුරු සපයන්න.**

**පහත දැක්වෙන ලී කුට්ටියේ පැති හයේම තීන්ත ආලේප කර කුඩා ඉරි දිගේ කැපීමෙන් කුඩා ඝනක කැට 27 ක් සාදා ගනු ලැබේ.**



03. මෙහි පැති දෙක බැගින් තීන්ත ආලේප වූ කුඩා ඝනක කැට කීයක් තිබේ ද?

1. 8 2. 12 3. 10

04. මෙහි එක් පැත්තකවත් තීන්ත ආලේප නොවූ කුඩා ඝනක කැට කීයක් තිබේ ද?

1. 1 2. 2 3. 3

- **මේනුජ A සිට B දක්වා ගමන් කළ ගමන් මාර්ගය පහත දැක්වේ. ඒ ඇසුරින් අංක 5 සහ 06 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**



05. මේනුජ වැඩිම වාර ගණනක් ගමන් කර ඇත්තේ කුමන දිශාවට ද?

1. බටහිර දිශාවට ය. 2. උතුරු දිශාවට ය 3. නැගෙනහිර දිශාවට ය.

06. මේනුජ ගමන් කර ඇති අනු දිශාව ට ප්‍රතිවිරුද්ධ දිශාව කුමක්ද?

1. ඊසාන 2. වයඹ 3. ගිනිකොණ

07. අප අනිවාර්යයෙන් ම පාසල් යා යුත්තේ,

1. උසස් රැකියාවක් ලබා ගැනීමට
2. යහපත් පුරවැසියෙක් වීමට
3. පාසල් අධ්‍යාපනය ලබා විශ්ව විද්‍යාලයට යාමට

08. මුහුදේ නිතරම දැකිය හැක්කේ,

1. මාළු සහ ධීවරයින් 2. ජලය සහ දියරැලි 3. නැව් සහ බෝට්ටු

09. හිස්තැනට ගැළපෙන සංඛ්‍යාව තෝරන්න.

2 ⟶ 5
3 ⟶ 7
4 ⟶ 9
5 ⟶ .....

1. 26 2. 11 3. 12

10. **5425** යන සංඛ්‍යාවේ 4 ඉලක්කමෙන් නිරූපිත අගය 2 ඉලක්කමෙ හි නිරූපිත අගය මෙන් කී ගුණයක් ද?

1. දෙගුණයකි. 2. විසි ගුණයකි. 3. පහළොස් ගුණයකි.

11. පහත දැක්වෙන රූපයේ පාටකර ඇති කොටසේ විශාලත්වය මුළු රූපයේ විශාලත්වයෙන් කුමන භාගයක් ද?



1. $\frac{3}{6}$
2. $\frac{4}{9}$
3. $\frac{1}{3}$

- **පහත අංක 12 සහ 13 ප්‍රශ්නවල සංඛ්‍යා රටාව අනුව හිස් තැනට ගැළපෙන සංඛ්‍යාව සොයන්න.**

12. 


1. 20 2. 10 3. 16

13.

| | | |
|---|---|---|
| 12 ⟶ | 30 | ⟵ 5 |
| 6 ⟶ | 27 | ⟵ 9 |
| 8 ⟶ | ...... | ⟵ 4 |

1. 16 2. 18 3. 24

14. රූපයේ දැක්වෙන්නේ කඩදාසියකින් දෙකට නවන ලද හැඩයකි. කඩ ඉරි දිගේ කැපූවිට ලැබෙන චතුරස්‍ර ගණන හා ත්‍රිකෝණ ගණන පිළිවෙළින් ඇතුළත් පිළිතුරු වන්නේ,




1. 0,6 2. 1,4 3. 2,4

**15.** රටාවක් ලැබීමට ඉවත් කළ යුතු සංඛ්‍යා දෙක තෝරන්න.

**1990 , 2010 , 2020 , 2030 , 2040 , 2050 , 2070**

1. 2010 සහ 2040 2. 2020 සහ 1990 3. 2020 සහ 2040

16. 20 වන සියවසේ 9 වන දශකයට අයත් වර්ෂයක් වනුයේ ,

1. 1998 2. 1988 3. 2009

17. 400යේ බාගයෙන් $\frac{2}{5}$ ක් කීය ද?

1. 200 2. 40 3. 80

18. 2019 වර්ෂයේ ජනවාරි පළමුවෙනිදා බදාදා දවසකි. 2020 ජනවාරි පළමුවෙනිදා බ්‍රහස්පතින්දා දවසකි. එසේ නම් 2021 ජනවාරි පළමුවෙනිදා වනුයේ,

1. සිකුරාදා දවසකි. 3. සෙනසුරාදා දවසකි. 3. බ්‍රහස්පතින්දා දවසකි.

- **අංක 19 සහ 20 ප්‍රශ්නවලට රටාව අනුව ඊළඟට ආ යුතු රූපය තෝරා යටින් ඉරක් අඳින්න.**

19.





1. 2. 3.

20.





1. 2. 3.

- **අංක 21 සහ 22 ප්‍රශ්නවල ප්‍රකාශ වලට නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.**

**පලතුරු වෙළඳ සැලක විකිණීමට තිබූ පලතුරු ප්‍රමාණයන් මෙසේය.**

| අඩුයි → වැඩියි<br>වැඩියි ← අඩුයි | පේර → අඹ | දිවුල් ← අඹ |
|---|---|---|

21. වෙළඳ සැලේ වැඩියෙන් ම විකිණීමට ඇති පලතුරු වර්ගය වනුයේ,

1. අඹ 2. පේර 3. දිවුල්

22. එක් එක් පලතුරු වර්ගය වැඩි බවේ සිට අඩු බවට පෙළ ගැස් වූ විට නිවැරදි අනුපිළිවෙළ වන්නේ ,

1. පේර , අඹ , දිවුල් 2. දිවුල්,අඹ, පේර 3. දිවුල් , පේර, අඹ

- **කවිය කියවා අංක 23 සහ 24 ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරන්න.**

*සමන් පිච්ච මල් ඉහිරුණු*

*නිල් තණකොළ පිටට්නියක්*

*වගෙයි අහස අන්න බලනු*

*කොච්චර ලස්සන ද රැට*

23. කවියේ සඳහන් පරිදි **සමන් පිච්ච මල් ඉහිරුණු නිල් තණකොළ පිට්ටනියකට** සමාන කර ඇත්තේ ,

    1. රාත්‍රී අහස 2. දිවා අහස 3. මල් පිපි තිබීම

24. සමන් පිච්ච මල් ලෙස කවියා දැක ඇත්තේ මොනවා ද?

    1. සඳ 2. තරු 3. වලාකුළු

25. ප්‍රියන්ත සරත්ට වඩා මිටිය. කුමාර සරත්ට වඩා උසය . අසේල සරත්ට වඩා උස නමුත් කුමාර තරම් උස නැත. මෙම සිව්දෙනා අතරින් උස වැඩිම තැනැත්තා කවුද?

    1. කුමාර 2. සරත් 3. අසේල

26. පියෙක් තමා ළඟ තිබූ මුදලෙක් 2/5 ක් ආහාර සඳහා වියදම් කර ඉතුරු මුදල දරුවන් තිදෙනා අතර සමසේ බෙදා දෙන ලදි. එක් දරුවෙකුට ලබා දුන් මුදල රු. 35 ක් නම් තාත්තා ළඟ තිබූ මුළු මුදල සොයන්න.

    1. රු.125 2. රු.150 3. රු.175

27. නිමල්ගේ දැන් වයස අවුරුදු 12 කි. ඔහුගේ පියාගේ වයස නිමල්ගේ වයස මෙන් 4 ගුණයකට වඩා අවුරුදු 4 ක් අඩුය. දැන් පියාගේ වයස කීය ද?

    1. අවු. 48 2. අවු. 52 3. අවු. 44

28. දින 31 ක් ඇති එක්තරා මාසයක පළමු වෙනිදා බදාදා දවසකි. එම මාසයේ 31 වෙනිදා,

    1. බ්‍රහස්පතින්දා දවසකි. 2. සෙනසුරාදා දවසකි. 3. සිකුරාදා දවසකි.

29. රූපයේ තිබෙන ත්‍රිකෝණ සංඛ්‍යා කීය ද?



    1. 7 2. 8 3. 5

30. නිරෝගී එළු රංචුවක සිටින එළුවන්ගේ පාද ගණන හා අං ගණනේ එකතුව 300 කි. එළු රංචුවේ සිටින  එළුවන් ගණන සොයන්න.

1. 50      2. 60      3. 75

31. රූපවල දැක්වෙන දේවල් සම්බන්ධ කාර්යය අනුපිළිවෙළින් අඩංගු පිළිතුර තෝරන්න.





1. වීදීම , කැපීම , තට්ටු කිරීම
2. කැපීම , විදීම, තට්ටු කිරීම
3. තද කිරීම , කැපීම, තට්ටු කිරීම

32. රූපයේ දක්වා ඇති ත්‍රිකෝණ තුළ ඇති එක් ඉලක්කම බැගින් ගෙන සෑදිය හැකි කුඩාම සංඛ්‍යාව කුමක් ද?




1. 1327      2. 1237      3. 1234

33. කුමාර ළඟ තිබූ මුදලට වඩා රුපියල් 25 ක් වැඩියෙන් කුමාරි ළඟ තිබුණි. කුමාරි රුපියල් රුපියල් 15ක් කුමාරට දුන් විට, කුමාර ළඟ ඇති මුදල කුමාරි ළඟ ඇති මුදලට වඩා,

1. රුපියල් 5 ක් අඩුය.      2. රුපියල් 10 ක් වැඩිය.      3. රුපියල් 5 ක් වැඩිය.

34. තික්ෂණ බංකුවක වාඩි වී සිටියි. ඔහුට ඉදිරියෙන් ළමුන් 6 දෙනෙක් ද, පිටුපසින් 9 දෙනෙක් ද සිටිති. බංකුවේ සිටින මුළු ළමුන් ගණන සොයන්න.

1. 14      2. 15      3. 16

35. රූපයේ දැකිය හැකි  සමචතුරස්‍ර ගණන කීය ද?



1. 14
2. 13
3. 12

- **සංකේත ඇසුරින් දී ඇති ගැටලුව විසඳා අංක 36 හා 37 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

| |
|---|
| △ x △ = ○ |
| ○ − △ = △ + △ |

36. ත්‍රිකෝණයේ වටිනාකම කීය ද?

1. 4     2. 6     3. 3

37. ○ + ○ x △ හි අගය සොයන්න.

1. 54     2. 21     3. 16

38. පහත රූපයේ විශාලත්වය, අඳුරු කළ කොටසේ විශාලත්වය මෙන් කී ගුණයක් ද?



1. පස් ගුණයක්     2. හත් ගුණයක්     3. අට ගුණයක්

39.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 7 | 8 | 5 | 3 | 4 | 6 | 1 | 2 |

මෙහි දැක්වෙන ඉලක්කම් අට අවරෝහණ ක්‍රමයට සැකසීම සඳහා අවම වශයෙන් ඉලක්කම් කීයක පිහිටීම වෙනස් කළ යුතු ද?

1. 4     2. 3     3. 5

40. අංක 1සිට 100 තෙක් සංඛ්‍යා ලිවීමේ දී 0 ඉලක්කම ලියවෙන වාර ගණන කීය ද?

1. 9     2. 11     3. 10